# බළන්ගොඩ නගර සභාව

## 2020-08-18 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2020.08.18**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභාවේ සභා වාර්තාව හා විශේෂ මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-06-30 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව හා 2020-07-16 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් 2020-06-30 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව හා 2020-07-16 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි ගරු සභාපතිතුමා විමසා සිටි අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා අදහස් දක්වමින් 06.01.66 යෝජනාවේ සඳහන් තම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ "ස්පිකර් සෙට් එකක් මිළදී ගැනීම" යනුවෙන් සටහන්ව ඇති කොටස " බෆල් සෙට් එකක් මිළදී ගැනීම"යනුවෙන් වෙනස් විය යුතු බව පවසන ලදී. එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් 35 පිටුවේ සඳහන්ව ඇති තම යෝජනා "ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සභාවට ඉදිරිපත් කළ බවට සටහන්ව ඇති අතර එය ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා ලෙස වෙනස්විය යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා, 08.02.03 යෝජනාව යටතේ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් හරක් මස් කඩය සඳහා ඉලෙක්ට්‍රෝනික් තරාදියක් තැබීම සුදුසු බවට යෝජනා කළ අතර එය සටහන් වී නොමැති බව පවසන ලදී.

එමෙන්ම ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 06.01.15 යෝජනාවේ RV 8543 වෙනුවට HI 2234 යනුවෙන් වෙනස් විය යුතු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- සභාවේ සියළු දෙනාම දැන උගත් බුද්ධිමත් සභිකයින් ලෙස සභාව සඳහා ඇහුම්කන් දී දුරකථන ක්‍රියා විරහිත කරගනිමින් සභාව සඳහා අවධානය යොමුකරන ලෙස පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම.**

- ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අසනීප තත්ත්වයේ පසුවන නිසා අද දින නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා ඇති බැවින් එතුමියගේ නිවාඩු අනුමත කරන බව පවසන ලදී.

- ගිණි නිවන රථයේ රාජකාරි ඉටු කිරීමේදී අවශ්‍ය උපාංග නොමැති වීම හා විධිමත් පුහුණුවක් නොමැති වීම නිසා විවිධ අවස්ථාවලදී ඇතැම් නිළධාරීන්ගෙන් චෝදනා ලැබීමට සිදුවන බැවින් එම සේවාවෙන් තම කණ්ඩායම ඉවත් කරන ලෙස ගිණි නිවන රථයේ සේවය කරන සේවකයින් විසින් සිදුකරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පැවසූයේ රත්නපුර හැරුණු කොට පවතින එකම ගිනි නිවන රථය බළන්ගොඩ නගර සභාව සතුව පවතින නමුත් එහි අවශ්‍ය උපාංග නොමැති අතර විධිමත් පුහුණු සේවක පිරිසක් නොමැති බවත් ය. එසේ වුව ද හදිසි ගිනි ගැනීම් අවස්ථාවල දී මෙම ගිනි නිවන රථය යොදාගෙන සේවක පිරිස් විසින් අදාල ගින්න නිවීමේ කටයුතු අවම පහසුකම් යටතේ දී වුව ද සිදු කරන බැවින් මේ සඳහා අවශ්‍ය උපාංග ලබා ගැනීම ඉතා අත්‍යවශ්‍ය කරුණක් බව සඳහන් කළේය.

  මෙය අත්‍යවශ්‍ය සේවාවක් වන බැවින් මෙම කණ්ඩායම සඳහා පුහුණුව හා අවශ්‍ය උපාංග ලබාදීම සුදුසු බව ද එතෙක් ජීවිත හා දේපල ආරක්ෂාව උදෙසා මෙම සේවාව අවම පහසුකම් මධ්‍යයේ වුවද ලබා දිය යුතු බව ද සභාවේ මතය විය.

- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් බළන්ගොඩ නගරයේ මාළු අලෙවි කිරීම සඳහා ජංගම රිය අලෙවියක් සිදු කිරීමට සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙස ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ඔවුන් ඉල්ලා සිටින ස්ථානයක් ලබා දීමට සභාවේ විරෝධතාවය ප්‍රකාශ කළ අතර පොදු වෙළඳපොළෙහි ස්ථානයක් ලබා දීම සුදුසු බව සභාවේ මතය විය.

- බළන්ගොඩ නගර සභාව විසින් පෙහොය දිනයන්හි කඩ කාමර විවෘත නොකරන ලෙස දැනුම් දී තිබිය දී පසුගිය පොහොය දිනයන්හි විවෘත කරනු ලැබූ කඩ කාමර 27 පිළිබඳ ලබා ගත් වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මොවුන් හට දඬුවමක් ලබා නොදීම හේතුවෙන් මෙම තත්ත්වය තවත් ව්‍යාප්ත වී ඇති බවද නගරය සඳහා විනයක් තිබිය යුතු බවද නගර සභාව තුළ කඩ කාමර 2400 ක් පමණ තිබෙන බැවින් මෙම කඩ කාමර 27 පිළිබඳ තීරණයක් ගත යුතු බව ද පවසන ලදී. එබැවින් මේ සම්බන්ධව ඔවුන්ට ලිඛිතව ලිපියක් මඟින් දැනුම් දිය යුතු බව වැඩිදුරටත් පවසන ලදී.

  ඒ අනුව ලිපියක් මඟින් අදාළ කඩ හිමියන් දැනුවත් කිරීම සුදුසු බව සභාවේ මතය විය.

- දොරවෙල ඔය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධව NBRO ආයතනය වෙත කරන ලද යෝජනාව ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඒ සඳහා රු.මිලියන 300 ක මුදලක් අනුමත වී ඇති බව ද ඒ සඳහා අවශ්‍ය අනුමැතිය හා තාක්ෂණික දැනුම නගර සභාවෙන් ලබා දිය යුතු බව ද පවසන ලදී.

- උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි බස්ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය ලබා ගත් එම්.උදය ශාන්ත මහතා විසින් 2020 ජූලි මස බස්රථ සියල්ල ධාවනය නොවූ බැවින් ජූලි මස සඳහා සහනයක් ලබා දෙන මෙන් ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ඒ අනුව 2020 ජූලි මස සඳහා 10% ක මුදලක් අඩු කිරීම සුදුසු බව සභාවේ මතය විය.

- පෞද්ගලික පෙර පාසල් විෂබීජහරණය කිරීම සඳහා ඇතැම් පෙර පාසල් වලින් ඉල්ලීම් සිදු කර ලිපි එවා ඇති අතර එම ලිපි ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

04. කල් දී ඇති යෝජනා

**04:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

04.01.01 LR 2318L වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම අළුත් කිරීම වෙනුවෙන් Metropolitan office (Pvt) Ltd ආයතනයට මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.02 බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ CCTV කැමරා පද්ධතිය අක්‍රියවීම හේතුවෙන් පහත සඳහන් උපකරණ අළුතින් දැමීම සඳහා PC System වෙතින් ඉදිරිපත් කර ඇති අවම මිළ ගණන අනුමත කිරීම.

01.WD Purple 2TB 3.5 AV Hard Disk - RS.15,750.00 (2 year Warranty)

02.12V 5Amp Power Adapter - RS.2.750.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.03 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ප්‍රතිපාදන මඟින් ටකරන් 20 ක් මිළදී ගැනීම සඳහා අවම මිළ ගණන ලෙස පී.එම්.කේ හාඩ්වෙයාර්

වෙතින් ඉදිරිපත් කර ඇති රු.1,380.00 ක මිළ ගණන අනුමත කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.04 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ප්‍රතිපාදන මඟින් ඇඳි සහිත ප්ලාස්ටික් පුටු 60 ක් මිළදී ගැනීම සඳහා චතුර ෆර්නිචස් වෙතින් ඉදිරිපත් කර ඇති රු.1,340.00 ක මිළ ගණනට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.05 වාර්ෂික සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු.1,000.00 දක්වා වැඩි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.06 පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීමේ අවම ලංසු මුදල තීරණය කිරීම හා පොදු වැසිකිළි අලුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පසුගිය සභාවේ දී මේ සඳහා අනුමැතිය ලබා දුන් බවත්, පොදු වැසිකිළි, කුණු කසළ එකතු කිරීම හා ඉවත් කිරීම එකම අංගයක් ලෙස ටෙන්ඩර් කළ අතර, කුණු කසළ එකතු කිරීම හා ඉවත් කිරීම ටෙන්ඩරය සඳහා අවම ලංසු මුදල ප්‍රසිද්ධ නොකර තීරණය කළ යුතු බව ද අද දින සභාවේදී පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීම සඳහා අවම ලංසු මුදල තීරණය කළ යුතු බවද සඳහන් කළේය.

ලේකම්තුමිය විසින් පොදු වැසිකිළි තුනෙහි මාසික ආදායම හා වියදම් තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් අවම ලංසු මුදල වශයෙන් රු.70,000.00ක මුදලක් සුදුසු බවට යෝජනා කළ අතර ගරු සභාපතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මහජන පොළ පිරිමි වැසිකිළිය ඉතාම අබලන් තත්ත්වයේ පවතින බැවින් එය සකස් කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීම සඳහා අවම ලංසු මුදල රු.70,000.00 ලෙස ගණනය කර ටෙන්ඩර් කිරීමටත්, පොදු වැසිකිළි අලුත්වැඩියා කිරීමටත් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.07 ආපදා ණය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

01. කළමනාකරණ සේවා නිළධාරී - එන්.සී.කාමිලා මිය
 - රු.250,000.00 -2020 අගෝස්තු
02. මුරකරු - කේ.එල්.පුෂ්පකුමාර මයා
 - රු.250,000.00 - 2020 සැප්තැම්බර්
03. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු - ඩබ්.ජී.සරත් ආනන්දසෝම මයා
 - රු.250,000.00 - 2020 ඔක්තෝම්බර්
04. කළමනාකරණ සේවා නිළධාරී -ප්‍රීතිකා ඩී.උක්වත්ත මෙය
 - රු.250,000.00 - 2020 නොවැම්බර්

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.08 GK 1483 ට්‍රැක්ටර් රථයේ රේඩියේටරය හා ස්ටාටර් මෝටරය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.09 ZA 5039 JCB යන්ත්‍රයේ AC මෝටරය අලුත්වැඩියා කිරීම හා ඉදිරිපස හා පසුපස බකට්වල දත් අලුතින් දැමීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.10 GK 6227 ට්‍රැක්ටර් රථයේ එන්ජිම අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.11 226-7521 ටිපර් රථයේ ක්ලච් පද්ධතිය අලුත්වැඩියා කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම හා ඒ සඳහා HLW ඉන්ජිනියරින් ආයතනයෙන් පහත සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ලබා දී ඇති රු 57,110.00 ක මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් භාණ්ඩ මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | | |
|---|---|---|
| Ring Wheel (ස්ටාටර් මෝටරය සඳහා) | - | රු 9,880.00 |
| ක්ලච් රේසර් | - | රු.7,690.00 |
| ක්ලච් ප්ලේට් | - | රු.15,730.00 |
| ප්‍රෙෂර් ප්ලේට් | - | රු.23,810.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.12 226-7521 ටිපර් රථයේ ක්ලච් පද්ධතිය අලුත්වැඩියා කිරීමට නැෂනල් මෝටර්වේස් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.11,500.00 ක මිළ ගණන් අනුමත කර අදාළ සේවාව එම ආයතනයෙන් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.13 ND-5124 වෑන් රථයේ ක්ලච් පද්ධතිය අලුත්වැඩියා කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම හා ඒ සඳහා HLW ඉන්ජිනියරින් ආයතනයෙන් පහත සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ලබා දී

ඇති රු.34,360.00 ක මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් භාණ්ඩ මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය | එකක මිල |
|---|---|---|
| Clutch Bearing | 01 | 3,580.00 |
| Clutch Disk | 01 | 13,420.00 |
| Clutch Cover | 01 | 15,240.00 |
| Clutch washer | 01 | 435.00 |
| Clutch Washer | 01 | 360.00 |
| Bearing | 01 | 715.00 |
| Bke Oil 500ml | 01 | 610.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.14 RD 8000 ට්‍රැක්ටර් රථයේ පහත සඳහන් අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ෆෑන් පෙත්ත හා ෆෑන් බෙල්ට් එක, ෆෑන් පුලියේ රේසරය අලුත්වැඩියා කිරීම
- රේඩියේටරය අලුත්වැඩියා කිරීම
- ක්ලච් පද්ධතිය අලුත්වැඩියා කිරීම හා එම ට්‍රැක්ටරයේ ටේලරයේ ජැක් සීල් ගැසීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.15 ZA 5039 JCB රථයට 19.5X 24 ප්‍රමාණයේ ටයර් 02 ක් හා ටියුබ් 02 ක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා ඒ සඳහා අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති කුවුන් ටයර්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ඉදිරිපත් කර ඇති 12 Pr Armoor වර්ගයේ ටයරයක් සඳහා රු.84,000.00 බැගින් ටයර් 02 ක් හා ටියුබ් එකක් රු.7,600.00 බැගින් ටියුබ් 02ක් මිළදී ගැනීම සඳහා මිළ ගණන් අනුමත කර අදාළ සේවාව එම ආයතනයෙන් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.16 RC 1107 ට්‍රැක්ටර් රථයේ හයිඩ්‍රොලික් පොම්පය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.17 HF 8558 ට්‍රැක්ටරයේ පහත අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- බොනට් එක අලුත්වැඩියා කිරීම
- විදුලි පරිපථය අලුත්වැඩියා කිරීම
- ටිපර් හෝස් අලුත්වැඩියාව
- ගියර් බොක්ස් එක අලුත්වැඩියාව
- ඇම්ප් එක හා පීකරය අලුතින් දැමීම
- ටේලරය සෑදීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.18 ZA 5039 JCB යන්ත්‍රය මීටර් 500 පූර්ණ සේවා කිරීම සඳහා නියෝජිත ආයතනය වන ඇවන්ස් මාට් ඉන්ජිනියරින් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු. 94,779.78 මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.19 HF 7899 JCB යන්ත්‍රය 2020/2021 වර්ෂයෙහි රක්ෂණය කිරීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලින් ඉදිරිපත් කර ඇති රු.16,500.92 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.20 කාර්යාලයීය CCTV පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා PC Systems ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.50,250.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.21 226-7521 ටිපර් රථයේ පිටුපස දොරවල් දෙක අලුතින් සාදා වාහනය සම්පූර්ණයෙන් පින්තාරු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.22 ගබඩා අවශ්‍යතා සඳහා Topstar CE 255A Tonner මිළදී ගැනීම සඳහා PC Systems ආයතනයෙන් ඉදිරිපත් කර තිබූ රු.9500.00 අවම මිළ ගණන සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.23 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- දොරවෙල ඔය ශ්‍රමදාන කටයුතු සඳහා අවශ්‍ය ග්ලවුස් 200 ක් මිළදී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් වෙත රු.20,000.00 ක මුදලක් ගෙවීම.
- GK 1483 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් වෙත රු.15,625.00 ක මුදලක් ගෙවීම.
- RD 8240 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් වෙත රු.14,140.00 ක මුදලක් ගෙවීම.
- 2020 අප්‍රේල්, මැයි හා ජූනි මස සඳහා විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සඳහා රු.39,683.26 ක මුදලක් ගෙවීම.
- ගබඩාව සඳහා අවශ්‍ය Computer Sheet A5 (copy 04) බන්ඩල් 04ක් මිළදී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් වෙත රු.25,000.00ක මුදලක් ගෙවීම.

- පසුගිය සභා අනුමැතිය පරිදි සෞඛ්‍ය අංශයට හා ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් ආයතනය වෙත රු.154,040.00 ක මුදලක් ගෙවීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.24 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වව්චර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2020.07.09 | 2020.06.01 දින සිට 2020.06.30 දක්වා කර්මාන්ත අංශයේ කොන්ත්‍රාත් පදනමේ මේසන් හා කම්කරු වැටුප් ගෙවීම. | 46-7 | 019983 | 432,900.00 |
| | බස්නැවතුම්පල, මුරකුටිය හා පුස්තකාලය ඉදිරිපිට සිවිලිම ඉදිකරන වඩු කාර්මික හා කම්කරු වැටුප් ගෙවීම. | 46-8 | 019983 | 21,700.00 |
| | 2020.06.01 සිට 2020.06.30 වැසිකිළි නඩත්තුකරුගේ වැටුප් ගෙවීම. | 46-9 | 019983 | 35,100.00 |
| | 2020.06.01 සිට 2020.06.30 දක්වා පොලිතීන් තේරීම සඳහා වැටුප් ගෙවීම. | 46-10 | 019983 | 48,300.00 |
| | 2020.06.01 සිට 2020.06.30 දක්වා පොහොර හැලීම හා කසළ තේරීම | 46-11 | 019983 | 154,100.00 |
| | 2020.06.01 සිට 2020.06.30 දක්වා කසළ ඉවත් කිරීම හා කාණු ගොඩ දැමීම. | 46-12 | 019983 | 208,150.00 |
| 2020.07.13 | දුනුමඩලගහවත්ත ප්‍රදේශවාසීන්ගේ සුභ සාධක සංගමය - ඒ විලියම් මාවතේ රණවක මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම. | 50 | 019999 | 656,000.00 |
| | ශ්‍රම උදාන සුභසාධක සමිතිය - කිරිඳිගල ප්‍රජාශාලාව අසළ නුගමුලහේන මාර්ගය සංවර්ධනය කිරීම | 51 | 020000 | 203,000.00 |
| 2020.07.15 | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 ජූනි මස විදුලි බිල ගෙවීම. | 56 | 020005 | 32,856.80 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2020 ජූනි හා ජූලි මස කාර්යාලය, පොදුවෙළෙඳසැල, බැංකියවත්ත ප්ලාස්ටික් පොලිතීන් මධ්‍යස්ථානය, මහජන පොළ ජල බිල්පත් ගෙවීම. | 60 | 200007 | 29,159.02 |

| | | | | |
|---|---|---|---|---|
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය 2020 ජූනි මස බස්නැවතුම්පල ජලබිල්පත් ගෙවීම | 61 | 020007 | 41,099.00 |
| | Dialog Broadband Networks( Pvt) Ltd (Pv 261) Dialog Internet, Cloud Bill, සම්පත් පියස, බැංකියවත්ත 4G | 65 | 020011 | 21,147.80 |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය - 2020.04.20 සිට 2020.04.26 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම. | 67 | 020012 | 59,416.00 |
| 2020.07.20 | 2019 භාණ්ඩ සමීක්ෂණය සඳහා කාර්ය මණ්ඩලයට හා සභිකයින් සඳහා දීමනා ගෙවීම. | 102 | 020039 | 46,000.00 |
| | සෙවන ග්ලාස් හවුස් - බස්නැවතුම්පල වහලයේ ආලෝකය පතිත වීම සඳහා Clean Plastic මිළදී ගැනීම | 115 | 020050 | 15,960.00 |
| | පී.එම්.කේ.හාඩ්වෙයාර් -කර්මාන්ත අවශ්‍යතා සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම. | 118 | 020053 | 18,765.50 |
| 2020.07.22 | Dialog Broadband Networks( Pvt) Ltd – 2020 ජූනි මස කාර්යාලීය Dialog Cloud බිල්පත ගෙවීම | 125 | 020061 | 11,340.00 |
| 2020.07.23 | බී.කේ.ජේ.අමරදාස - 2020.06.01 සිට 2020.07.05 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 133 | 025601 | 229,739.02 |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය - 2020-05-31 සිට 2020-06-15 දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 134 | 025602 | 132,405.31 |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය - 2020-06-16 සිට 2020-06-30 දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 135 | 025602 | 79,219.29 |
| | නීතිඥ ඩී.එම්.චන්ද්‍රසේකර 2020.02.05 දින 2609, 2611, හා 2020-01-16 දින 327/යොමු නීති කෘත්‍ය සඳහා පෙනී සිටිම වෙනුවෙන් නීතිඥ ගාස්තු ගෙවීම | 143 | 025609 | 12,000.00 |
| | එස්.ඒ.තුෂාරි සංජීවනී - ලිඛිත දේශන සකස් කිරීම. - WA 25/2019 නඩුව වෙනුවෙන් ගෙවීම | 144 | 025610 | 25,000.00 |
| | එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය - බළන්ගොඩ පරිවාස කාර්යාලයේ අත්‍යවශ්‍ය ඉදිකිරීම කර්මාන්තයේ 10% රැඳවුම් ගෙවීම | 156 | 025615 | 175,368.00 |
| 2020.07.30 | Dialog Broadband Network Pvt Ltd (Pvl 261) - 2020-06-11 දින සිට 2020-07-10 දක්වා කාර්යාලයේ දුරකථන හා Internet බිල් ගෙවීම. | 164 | 025624 | 16,614.90 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.25 බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ අපජල පෙරහන් පද්ධතිය සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ගලි ප්‍රතිකාරක පද්ධතිය සහ කසළ අංගනයෙන් නිකුත් වන අප ජලය පිරිපහදු කිරීම යන අංග දෙක සඳහා පෙරහන් පද්ධතියක් නිර්මාණය කිරීම වෙනුවෙන් සැලැස්මක් සකස් කිරීමට ජාතික කාර්මික ආයතනයෙන් උපදෙස් විමසීමට සභාවේ එකඟතාවය ලැබුණු අතර මෙම අංග දෙක සඳහාම පෙරහන් පද්ධතිය සකස් කළ යුතු බව ද ඒ සඳහා සැකැස්ම සකස් කිරීමට රු.100,000.00 ක මුදලක් වැය වන බව ද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.25 අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, පළාත් පාලන ආයතන විසින් අනුමැතියට යොමු කරනු ලබන බොහෝ අතුරු ව්‍යවස්ථාවල අඩුපාඩු පවතින බැවින් එසේ අනුමැතියට යොමු කරනු ලබන අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන්

- අක්ෂර වින්‍යාසය
- වචන අතර පරතරය තැබීම
- පනත්වල වගන්ති යෙදීමේදී නිවැරදි භාවය
- ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල වගන්ති අතර පරස්පරතා

ආදී කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කරන ලෙස පවසා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ACLG 01/20 හා 2020.07.27 දිනැති ලිපිය මගින් දන්වා ඇති බව පවසන ලදී.

එබැවින් එම කමිටුව සඳහා සභික නියෝජිතයින් වශයෙන් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රීනි එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය පත්කිරීමටත්, ප්‍රජා සංවර්ධන නිළධාරී

කේ.ඩබ්.එම්.ගාමිණී වීරසිංහ මහතා, ගණකාධිකාරි එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා, ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී ජී.ඩී.ඒ.සේමපාල මහත්මිය, ප්‍රධාන සංවර්ධන නිළධාරී ටී.ජී.කේෂණී ප්‍රසාදිකා මහත්මිය හා සංවර්ධන නිළධාරී හිමාලි අප්සරා මහත්මිය පත්කිරීමටත්, ඉංග්‍රීසි පරිවර්තනය සඳහා නවරත්න බණ්ඩාර මහතාත්, දමිළ පරිවර්තනය සඳහා ජෙයරාජන් මහතාත් පත්කිරීමත් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.27 තණකොළ කපන මැෂින් දෙකක් මිළදී ගැනීම සඳහා කැළණී ඒජන්සීස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රු.23,500.00 X 2 ක අවම මිළ ගණන අනුමත කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.28 JCB යන්ත්‍ර පූර්ණ සේවා කිරීම සඳහා සේවා ආයතනවලින් ලබා ගත් මිළ ගණන් අනුව රිෂානා සර්විස් ආයතනයෙන් කොටස් කිහිපයකට පමණක් මිළ ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනය හා රිෂානා සර්විස් ආයතනයේ මිළ ගණන් සැසඳීමේදී කේ.ඒ.ඔටෝ ආයතනයේ මිළ ගණන් අවම මිළ ගණන් විය. ඒ අනුව කේ.ඒ.ඔටෝ ආයතනයෙන් පූර්ණ සේවා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.29 2020 වීථි පහන් නඩත්තු සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.30 මහජන පොළ පොදු වැසිකිළිය සඳහා ජල මෝටරයක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.31 පුස්තකාල උපදේශක කමිටුව මගින් නිර්දේශ කරන ලද යෝජනා සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- 2020 වර්ෂය සඳහා පොත් මිළදී ගැනීම.
- මහජන පුස්තකාලයට අනුබද්ධිත ශාඛා පුස්තකාල ඇති කිරීම.

පහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.32 වීථි පහන් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම.

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| C.F.L.30w Bulb | 500 |
| S.L.Fitting set | 50 |
| Screw Holder | 300 |
| 1/044 Wire Roll (100m) | 16 |
| Tape Roll | 48 |
| Tester | 05 |
| Thamler Switch | 100 |
| Line Tap Set | 100 |
| Binding Wire (Alluminium) | Roll 01/20Kg |
| LED Cobra 100W Bulb Set | 48 |
| Forceps (Safty) | 02 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.33 කාර්යාලය සඳහා අවශ්‍ය පහත සඳහන් උපකරණ ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | ප්‍රමාණය |
|---|---|
| කැල්කියුලේටර් | 10 |
| දෙපියන් ෆයිල් | 200 |
| පෝස්ට් ඉට් පැකට් | 15 |

| | |
|---|---|
| කාඩ්බෝඩ් ෆයිල් | 300 |
| මිනි සබන් | 400 |
| 9○4 ලියුම් කවර | 1000 |
| පොඩි ලියුම් කවර | 1000 |
| පැන්සල් | 30 |
| හයිලයිට් පෑන් | 20 |
| වයිට්බෝඩ් පෑන් | 20 |
| මකන | 15 |
| ස්ටෙප්ලර් කටු | පෙට්ටි 02 |
| ටිපෙක්ස් | 20 |
| CR 1 | 20 |
| CR 2 | 20 |
| CR 3 | 20 |
| CR 5 | 50 |
| ෆීල්ඩ් නෝට් බුක් | 20 |
| Computer Sheet A4 Size 4Ply | පෙට්ටි 10 |
| හාෆ්ෂීට් | බන්ඩල් 05 |
| ඉන්ක් පෑඩ් | 04 |
| ලොකු ඉබි යතුරු | 10 |
| මධ්‍යම ප්‍රමාණයේ ඉබි යතුරු | 10 |
| පොඩි බැටරි | 40 |
| ඔරලෝසු බැටරි | 40 |
| කතුරු | 10 |
| රතු පාට A4 | බන්ඩල් 01 |
| A3 කොළ | බන්ඩල් 05 |
| ලීගල් කොළ | බන්ඩල් 05 |
| පොළ පොත් | 200 |
| වවුචර් | 1000 |
| 10x15 ලියුම් කවර | 75 |
| Computer Sheet A4 (two Copy) | 04 |
| Computer Sheet A4 (One Copy) | 04 |
| විම් සබන් | 50 |
| OE Bottle | 20 |
| 85A Tonner | 15 |
| LQ 300 Epson Ribbon | 10 |
| MP 2014HS Toner | 02 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.34 සභාවේ වාහන සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 600x16 | 08 |
| 700X16 | 10 |
| 750X16 | 04 |
| 12.4x28 | 04 |
| 700x15 | 03 |
| 650X16 | 02 |
| 13.6X28 | 05 |
| 12.5X80.18 | 02 |
| 19.5X24 | 01 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.35 කර්මාන්ත කටයුතු සඳහා ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා මිළදී ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

| | | | |
|---|---|---|---|
| 4' ඩ්‍රෙනේජ් බට | 05 | 4' බෙනඩ් | 05 |
| 4' එල්බෝ | 05 | 4' T ජොයින්ට් | 05 |
| 2' PVC බට | 10 (P.N.T.7) | 2' සොකට් | 10 |
| 1 ½' PVC බට | 10 (P.N.T.7) | 1 ½' සොකට් | 10 |
| 1 ¼' PVC බට | 10 (P.N.T.7) | 1 ¼' සොකට් | 10 |
| 1' PVC බට | 25 (P.N.T.7) | ¾' PVC බට | 10 |
| ¾' සොකට් | 10 | ½' බට | 50 |
| ½' සොකට් | 25 | ½' එල්බෝ | 50 |
| ½' T ජොයින්ට් | 25 | ¾' එල්බෝ | 10 |
| ¾' T ජොයින්ට් | 10 | ¾' පෝසස් සොකට් | 10 |
| 2' පෝසස් සොකට් | 10 | 2' වැල් සොකට් | 10 |
| ½' පොසස් සොකට් | 15 | ½' පොසස් එල්බෝ | 10 |
| ½' පොසස් ටී | 15 | 1' බෙනඩ් | 10 |

| | | | |
|---|---|---|---|
| 1' එල්බෝ | 10 | 1' T ජොයින්ට් | 10 |
| 1' පොසස් සොකට් | 10 | 1 X ½' රෙඩියුස්සොකට් | 10 |
| 1 ¼' X 1 රෙඩියුස්සොකට් | 10 | ½' බෙනඩ් | 15 |
| 2' බෙනඩ් | 05 | එක්ස්ලෝන් ගම් (90 g ) | 15 |
| 1' ත්‍රෙඩ්සීල් | 15 | ¾' ත්‍රෙඩ්සීල් | 15 |
| ½' ත්‍රෙඩ්සීල් | 20 | ½' ගාර්ඩන් ටැප් | 20 |
| ½' PVC වොෂ්බේසින් ටැප් | 10 | 1 ½' PVC වැල් | 10 |
| 4' කොන්ඩිපට්ටම් | 10 | 3' කොන්ඩිපට්ටම් | 10 |
| 4' සොයිබ | 10 | 3' සොයිබ | 10 |
| 1 ½' ඉබි යතුරු | 10 | 2' ඉබි යතුරු | 10 |
| 1' සකෘ ඇණ | 1 (පෙට්ටි) | 1 ½' සකෘ ඇණ | 1 (පෙට්ටි) |
| දඬු අඬු | 1 | 4' ගිනි ගල් | 05 |
| හැක්සෝ තල | 24 | ග්‍රයින්ඩල් තල 4' කොන්ක්‍රීට් | 05 |
| 4' ග්‍රයින්ඩල් තල | 05 | නො.12 වැල්ඩින් කූරු | 05 (පෙට්ටි) |
| ග්‍රීල් කටු | 10 | 3' ක්ලිප් (G.I) | 25 |
| 4' පින්සල් | 05 | 2' පින්සල් | 05 |
| 1 ½' වැල් සොකට් | 20 | 1' ගෙට් වැල් | 10 |
| ½' ගෙට් වැල් | 10 | ½' වැල් සොකට් | 30 |
| 1' වැල් සොකට් | 20 | 2' වැල් | 05 |
| 2' වැල් සොකට් | 10 | 2' ෆෙක්සිබල් හෝස් | 15 |
| සිලිකන් ගම් | 10 (පොඩි) | ½' බෝල් වැල් | 10 |
| 1' බෝල් වැල් | 03 | 1 ¼' බෝල් වැල් | 02 |
| 1 ½' බෝල් වැල් | 02 | බිලේ ෂවර් | 05 |
| කොමඩ් කවර් ෂීට් | 05 | 1' ක්ලිප් (G.I) | 25 |
| ¾' ක්ලිප් (G.I) | 25 | ½' ක්ලිප් (G.I) | 100 |
| ½' ඇන්ගල් වැල් | 10 | 3' ඩවුන් පයිප්ප | 10 |
| 3' එල්බෝ (ඩවුන් පයිප්ප) | 15 | 2' T ජොයින්ට් | 05 |
| ½' ගාර්ඩින් ටැප් | 10 | ½' PVC වැල් | 15 |
| ½' එන්කප් | 10 | ½' සොකට් | 50 |
| සිස්ටන් බෝල් වැල් | 10 | | |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.36 නව බස්නැවතුම්පල අංක සී 17 කඩ කාමරයේ බදු අයිතිය සංශෝධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ බස් නැවතුම්පල සී 17 කඩ කාමරයේ බදු අයිතිකරු වූ ජී.එච්.සුමතිපාල යන අය මිය ගොස් ඇති බැවින් ඇගේ බිරිඳ වන එච්.කේ.නන්දනී අල්විස් යන අයගේ නමට එම කඩ කාමයේ බදු අයිතිය සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා සිටින බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.37 අන්තර්ජාලය තුළින් මුදල් ගෙවීම සඳහා ලංකා බැංකුව සමඟ ගිවිසුම් ගත වීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් අදහස් දක්වමින් මීට පෙරද එක් අවස්ථාවක මේ පිළිබඳව සාකච්ඡා කළ අතර සේවාව ලබා දීම වෙනුවෙන් බැංකුව විසින් අය කරන මුදල පාරිභෝගිකයාගෙන් අය කර ගන්නා ලෙසට පළාත් සභාව මඟින් ප්‍රකාශ කරන ලද බව ද මෙය ක්‍රියාත්මක කිරීමේදී එම ගාස්තුව අය කර ගැනීමට පාරිභෝගිකයා කැමතිද යන්න විමසා සිටින ලෙස ද පවසන ලදී.

මෙයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ සඳහා කැමති පාරිභෝගිකයින් සඳහා මෙම ක්‍රමය යටතේ මුදල් ගෙවිය හැකි අතර අනෙකුත් පාරිභෝගිකයින් සඳහා කාර්යාලය වෙත පැමිණ සුපුරුදු පරිදි මුදල් ගෙවිය හැකි බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.38 පොදු වෙළෙඳසැල අංක 07 කඩ කාමරය මේ වන විට මුද්‍රා තබා ඇත. ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ගය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා රු.3,000.00 ක අවම මිළ ගණන් යටතේ ටෙන්ඩර් කිරීම සුදුසු බවට යෝජනා කළ අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.39 සභාව සතු දේපලවල ආදායම අය නොවීම සම්බන්ධයෙන් සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල ඉඩම් වල විස්තර හා ඉඩම් වල පදිංචිකරුවන්ගේ විස්තර මේ වන විට ගෙවිය යුතු හිඟ මුදල් ආදිය පිළිබඳ විස්තර ලබා ගෙන අදාළ අයට මෙම ඉඩම් පැවරීම සුදුසු බව සභාවේ මතය විය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.40 සේවාලාභී ප්‍රඥප්තිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.41 2020-2023 සිව් අවුරුදු සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.42 බැංකියවත්ත කසළ අංගනයේ අක්‍රමවත්ව ඇති කුණු කන්ද පහළට ගලා ඒම වැළැක්වීම සඳහා පියවරෙන් පියවර ක්‍රමානුකූලව සකස් කිරීම. (දළ ඇස්තමේන්තුව - රු.650,000.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.43 2020 අගෝස්තු මස ඉටු කිරීමට අපේක්ෂිත කර්මාන්ත සඳහා අනුමැතිය ලබා ගැනීම.

01. බළන්ගොඩ පොලීසියේ බැරැක්කය දෙපස කැඩී බිඳී ගොස් ඇති බැවින් එය නඩත්තු කිරීම.
02. මහජන බැංකුව අසල තානායම අඹ ගහ වටේ බැම්ම සැකසීම.
03.මුගුණමලේ මාර්ගයේ ඉහළ කොටස නඩත්තු කිරීම.
04. කරව්කැටිය මාර්ගයේ කොටුගොඩැල්ල පාර දක්වා පෙට්ටිගල මාර්ගයට යා වන වටරවුම් පාරේ නගර සභාවේ සිට දෙමළ විද්‍යාලය දක්වා එක් පැත්තක කාණුව වසා කොන්ක්‍රීට් ස්ලැබ් යොදා සංවර්ධනය කිරීම.
05. කරව්කැටිය කොටුගොඩැල්ල මාර්ගයේ දුර මීටර් 40 ක ප්‍රමාණයක කාණු අළුතින් යෙදීම.

මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

| මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය | රථවාහන |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| Double Drum රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 20 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මහජන බැංකුව අසල අඹ ගහ වටේ බැම්ම සැකසීමේදී ඒ අසල චිත්‍ර ඇඳ ඇති බැම්මටද ආවරණයක් සකස් කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.44 බලංගොඩ නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ඉදිරිපත් කිරීම.

බලංගොඩ නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ඉදිරිපත් කිරීමේ යෝජනාව සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් 2019.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණනය කර ඇති බවත්, බළන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනට අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බවත් පැවසීය.

04.01.45 නගර සභා කම්කරුවෙකු ලෙස ශානක නයනප්‍රිය ඇල්බට් මහතා පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.46 ND-5124 වැන් රථයේ Dual A/C පද්ධතියට නව Evaporator එකක් සවිකර සම්පූර්ණ අලුත්වැඩියාවක් සිදුකර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.47 සම්පත් පියස දොර අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ජය ශ්‍රී ඉංජිනියර්ස් ආයතනයේ රු.16,000.00 මිළ ගණන් අනුමත කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය | මිළ |
|---|---|---|
| ස්ප්‍රීන් | 03 | රු.10,500.00 |
| පුලි රේසර් | 03 | රු.4,500.00 |
| ග්‍රීස් | 1Kg | රු.1,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04.01.48 2020 වර්ෂය සඳහා සභා අරමුදලින් රු.850,000.00 මුදලක් වැය කර පහත නම් සඳහන් අය වෙනුවෙන් එක් අයෙකුට රු.50,000.00 ක මුදලක් යොදවා වැසිකිළියක් තනා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| අනු අංකය | නම | ලිපිනය | යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමා/ මන්ත්‍රීතුමිය |
|---|---|---|---|
| 01 | ටී.ඒ.පුෂ්පා රේණුකා | අංක 408, උඩ ඇල්ලෙපොල, | ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා |

| | | | |
|---|---|---|---|
| | | බළන්ගොඩ. | |
| 02 | ඒ.එස්.එම්.ෂමාහිල් | 365/1, දෙහිගස්තලාව, බළන්ගොඩ. | ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 03 | චුල්ල මාධව | අංක 39/01, පරණ පාර, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 04 | ආර්.එම්.විජේරත්න | සඳුන්ගම, බැංකියවත්ත, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 05 | එම්.එම්.නාලිකා ප්‍රියදර්ශනී | 955 F, මෙගොඩ කිරිඳිගල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 06 | ඩබ්.ඒ.කේ. මහේෂ් නිලූෂ | 62/ 01, පුරණගෙදර පාර, ඕළුගංතොට, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07 | ජලාල්දීන් මොහොමඩ් ඉම්රාන් | 276, දෙහිගස්තලාව, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 08 | බී.ජී.කරුණාරත්න | නො.36, පරගහකුඹුර පාර, බෝම්බුව, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 09 | චාන්දනී කුමාරි වෙරළුපිටිය | 910, ජනපද පාර,කිරිඳිගල, බළන්ගොඩ. | ගරු නාගරික මන්ත්‍රී එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 10 | කාලිමුත්තු ජෙයරාජ් සරන්‍යා | 54/15/ A , රාස්සගල පාර, සඳුන්ගම, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රිනි එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 11 | එල්.ඒ.අමිල නුවන් | ශෛලතලාරාම මාවත, මෙගොඩ කිරිඳිගල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12 | එම්.කේ.ආනන්ද වීරකෝන් | 89/01 සයිමන් ස්ටෝර්ස් බාරේ, උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 13 | කේ.එල්.එන්.සාලිත කුමාරසිරි | 314/B, ගාලවත්ත, හුණුකුඹුර, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 14 | එන්.එල්.සමදරා ජයලත් | 153/B ,පිරුවන පාර, | ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස |

| | | | |
|---|---|---|---|
| | | කුමාරගම,<br>බළන්ගොඩ. | මැතිතුමා |
| 15 | එච්.එම්.ඉන්දික ප්‍රියශාන්ත | 140/23 ,රාස්සගල පාර, පල්ලෙවෙල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 16 | එච්.ඒ.මල්ලිකා | 20/24, පරණ පාර, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රි එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 17 | එම්.ඩී.රොහාන් ඉන්දික | සරස්වතී පාර, උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා |

2020 වර්ෂය සඳහා සභා අරමුදලින් රු.850,000.00 මුදලක් වැය කර පහත නම් සඳහන් අය වෙනුවෙන් එක් අයෙකුට රු.50,000.00 ක මුදලක් යොදවා වැසිකිළියක් තනා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතික සම්මත විය.**

04.01.48 ජල බවුසරය ලබා ගැනීම සඳහා ගෙවූ මුදල් ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.- එච්.එම්.තාරක නදීශාන් -රු.4,750.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05.මන්ත්‍රී යෝජනා**

**05.01 ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය**

05.01.01 බළන්ගොඩ කුමාරගම ශ්‍රී මලියදේව අවමංගල්‍යාධාර සමිතිය සඳහා බුෆේ සෙට් එකක් සහ වානේ කබඩ් එකක් (අල්මාරියක්) ලබා ගැනීම සඳහා පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දීම.

05.01.02 බළන්ගොඩ, උඩ ඇල්ලෙපොල, සරස්වතී පාර සුසාන භූමියෙහි ගොඩනැගිල්ල ඉතිරි කොටස ඉදි කිරීම සඳහා පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දීම.

ඉහත යෝජනා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තමන් වෙත ලැබෙන මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ 8 මගින් බළන්ගොඩ කුමාරගම ශ්‍රී මලියදේව අවමංගල්‍යාධාර සමිතිය සඳහා බුෆේ සෙට් එකක් සහ වානේ කබඩ් එකක් (අල්මාරියක්) ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන අතර ඉතිරි මුදල් සියල්ල යොදවා බළන්ගොඩ, උඩ ඇල්ලෙපොල, සරස්වතී පාර සුසාන භූමියෙහි ගොඩනැගිල්ල ඉතිරි කොටස ඉදි කිරීම සඳහා කටයුතු සිදු කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05.02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05.02.01 බුලත්ගම සිරි සුනන්දාරාම විහාරස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා සිමෙන්ති ලබා දීම. (පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන)

05.02.02 අබලන් වී ඇති බුලත්ගම විද්‍යාල මාවත සංවර්ධනය කිරීම (නඩත්තු)

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තමන්ගේ පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදා ගනිමින් 05.02.01 යෝජනාව ක්‍රියාත්මක කිරීමට සුදානම් වූ නමුත් තම මන්ත්‍රී ප්‍රතිපාදන අවසන් වී ඇති බව දැනගන්නට ලැබීම නිසා එය ඉටු කිරීමට නොහැකි වූ බව ද 05.02.02 යෝජනාව පිළිබඳ තමන් සභා කිහිපයකදීම කථා කළ නමුත් එය මේ වන තෙක් ඉටු වී නොමැති බවද එය හැකි ඉක්මනින් ඉටු කරන ලෙසද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05.03 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

05.03.01 2019/2020 මන්ත්‍රී ප්‍රතිපාදන වලට වෙන් කරන ලද මුදලින් මා විසින් දෙන ලද සංවර්ධන යෝජනාව කිරීමට නොහැකි නිසා වර්ෂය අවසාන වීමට පෙර එම මුදලනි තෝරා ගන්නා ලද ලියාපදිංචි සමිතිවලට සහ පූජනීය ස්ථානවලට සවි ශක්තිමත් ප්ලාස්ටික් පුටු සහ බෆල් දෙකක් සහිත ශබ්ද වාහිනී යන්ත්‍ර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## *06. කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ කරන ලද යෝජනා*

**06.01.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

06.01.01 බෝම්බුව සිට නගර සභාව, උඩකන්ද, ඇල්ලපොල යන මාර්ග සඳහා විකල්ප මාර්ගයක් වන බෝම්බුව වතුකාරගොඩ මාර්ගයේ කොටසක් කුඹුරට කඩාගෙන යාම නිසා සියළුම ගමනාගමන කටයුතු අඩාල වී ඇති බැවින් එය සකස් කිරීම.

06.01.02 පරගහකුඹුර මාර්ගය අසල පන්සල ඉදිරිපිට පැති කණ්ණාඩියක් සවිකරදීම.

06.01.03 නොයෙකුත් අක්‍රමිකතා හේතුවෙන් ඉඩම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බෝම්බුව මිහිදන් උයනේ ආරක්ෂිත පැති බැම්මේ කොටසක් ඉතිරි වී ඇති බැවින් හැකි ඉක්මනින් එය ඉදිකිරීම.

06.01.04 2020 වර්ෂයට ලැබීමට නියමිත ප්‍රතිපාදන මඟින් බෝම්බුව විමලසේන මහතාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම.

06.01.05 වතුකාරගොඩ බේබි ආච්චිගේ කඩය අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම.

06.01.06 බෝම්බුව එක්සත් අවමංගල්‍යාධාර සමිතියට පුටු 60 ක් ලබාදීම.
(ඉහත කර්මාන්ත ඉටුකිරීම - උඩකන්ද සුහද වැඩිහිටි සංගමය)

06.01.07 ගල්වල පාර කාණු පද්ධතිය පිළියෙල කිරීම.

06.01.08 සවස 6.00 සිට 8.00 දක්වා ක්‍රීඩා කිරීම සඳහා වතුකාරගොඩ වොලිබෝල් ක්‍රීඩා පිටිය සඳහා විදුලි ආලෝකය ලබාදීම සඳහා අනුමැතිය හා මූල්‍ය අනුග්‍රහය ලබාදිම. (තම ප්‍රතිපාදන මඟින්)

**හැකි ඉක්මනින් නඩත්තු කළ යුතු මාර්ග -**

06.01.09 ගල්වල පාර, පරගහකුඹුර පාර, කහටගහතැන්න පාර, උඩකන්ද පාර, මිරිස්කොටුව පාර, පූජාපිටිය පාර, කරව්කැටිය මාර්ගයේ අතුරු මාර්ග කිහිපයක්, වතුකාරගොඩ පාර

06.01.10 බෝම්බුව සේවා පියස තීන්ත ආලේප කිරීම.

06.01.11 බෝම්බුව ආචාරිමලේ දෙවන පටුමග කාණු පද්ධතිය පිළියෙල කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

පසුගිය දිනවල ඇදහැලුණු ධාරානිපාත වර්ෂාව නිසා වතුකාරගොඩ මාර්ගයේ කොටසක් කඩා ගෙන ගිය අතර පරගහකුඹුර මාර්ගය අසල පන්සල ඉදිරිපිට මාර්ගයේ ගමන් කරන වාහනවලට අනෙක් පසින් පැමිණෙන වාහන නොපෙනෙන බැවින් පැති කණ්ණාඩියක් සවිකර දෙන ලෙස පවසන ලදී. එමෙන්ම බෝම්බුව සුසාන භූමිය සතුව විශාල භූමි ප්‍රමාණයක් තිබූ නමුත් නොයෙක් හේතු නිසා එම භූමිය කුඩා වෙමින් පවතින බව ද එක් පැත්තක පමණක් ආරක්ෂක වැටක් ඉදිකර ඇති බැවින් අනිත් කොටසටද ආරක්ෂක වැටක් සකස් කරන ලෙස ද බෝම්බුව සේවා පියසෙහි තීන්ත ආලේප කර දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.02. ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

06.02.01 හුණුකුඹුරගම ඒ.එම්. ලීලාවතී මහත්මියගේ නිවස පිටුපස මාර්ගයේ ජලය බැස යාමේදී නිවස පිටුපස බැම්මට ඉහළින් ජලය ගලායාම නිසා නිවසට හානි වී ඇත. මෙම බැම්ම අඩි 30 ක් පමණ ඇති බැවින් අඩියක් පමණ ඉහළට ඔසවා සකස් කර දෙන මෙන් ඉල්ලමි.

06.02.02 හුණුකුඹුරගම රොෂාන් කැලිස්ටස් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කරන තෙක් එම මාර්ගය ජේ.සී.බී.යන්ත්‍රය යොදා සුදුසු ලෙස සකස් කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය හුණුකුඹුරගම ඒ.එම්.ලීලාවතී මහත්මියගේ නිවස පිටුපස බැම්මට ඉහළින් ජලය ගලා යාම නිසා එම නිවසට හානි සිදුවී ඇති බවද එබැවින් එම බැම්ම තවත් අඩියක් පමණ උස් කරන ලෙසද පවසන ලදී. එමෙන්ම රොෂාන් කැලිස්ටන් මහතාගේ නිවසට යන මාර්ගයෙහි පස් ගොඩ වී ඇති බැවින් එම මාර්ගය සංවර්ධනය කරන තෙක් එම මාර්ගයේ යාමට හැකි වන ලෙස සකස් කර දෙන ලෙසද පවසන ලදී. එමෙන්ම ඉහත කාර්යයන් දෙක සඳහා JCB යන්ත්‍රය ලබා දෙන ලෙසත් මීට පෙර අවස්ථාවකදී හුණුකුඹුර ගම සඳහා JCB යන්ත්‍රය ලබා දීම පිළිබඳ ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.03. ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

06.03.01 ගල්වල පාර අළුත්වැඩියා කිරීම

06.03.02 ශාන්ත මහතාගේ නිවස ඉදිරිපිට කාණුව සෑදීම.

06.03.03 මහමෙව්නාව පාර පටන් ගන්නා ස්ථානයේ ප්‍රධාන කාණුව සකස් කිරීම.

06.03.04 උඩකන්ද පාර ලයිට් කණුවලට නැවත විදුලිය ප්‍රතිසංස්කරණය කිරීම හා විදුලි බුබුළු සවිකිරීම.

06.03.05 පසුගිය කර්මාන්ත කමිටු යෝජනා මගින් යෝජිත කර්මාන්ත ඉටු වී ඇතිදැයි සොයාබලා විශ්ලේෂණය කිරිම.

ඉහත යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් අද දින සුනේත්‍රා මන්ත්‍රීතුමිය සභාවේ නොමැති වුවද එතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඉටු කරන ලෙසට ද උඩකන්දපාර ලයිට් කණු වල විදුලි බුබුළු අක්‍රිය වී ඇති බැවින් ඒවා යොදන ලෙස ද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.04. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී.ගුණරත්න මැතිතුමා**

06.04.01 කිවුලේවෙල පාලමේ ඉතිරි කොටස අවසන් නොකර එම පාලම ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් එහි ඉතිරි කොටස සභා අනුමැතියකින් අවසන් කර ඇත. නමුත් එම කාර්යය අවසන් කිරීමට රු. 800,000.00 ඉක්මවා රු.17,000.00 ක මුදලක් වැය විය. එම මුදල ගෙවීම සඳහා කමිටු අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම් කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා තම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ කිවුලේවෙල පාලමේ ඉතිරි කොටස කරගෙන යමින් පවතින විට එම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා රු.17,000.00 ක මුදලක් වැඩිපුර වැයවූ බැවින් එම මුදල පියවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.05. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

06.05.01 නිල නොලත් මහේස්ත්‍රාත් දේශබන්දු මහතාගේ නිවස අසලින් බලකොටුව පාරට යා වන කෙටි මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම ( රු.100,000.00)

06.05.02 සේනක පෙදෙසේ ප්‍රනාන්දු බාසුන්නැහේගේ නිවස අසල පාර හරහා ඇති ඉදුල් කාණුව සාදා කොන්ක්‍රීට් ස්ලැබ් යොදා සංවර්ධනය කිරීම (රු. 40,000.00)

06.05.03 හැටන් නැෂනල් බැංකුව අසලින් දිවෙන මාර්ගය ,එච්.එන්.බී. කාර් පාර්ක්, රසිකා ජෙම්ස්, සරත් මහතා, අර්ජුන මහතා, දසරද මහතා, සම්පත් මහතා,මහේන්ද්‍රන් මහතා යන අයගේ නිවෙස් පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම (රු.200,000.00)

06.05.04 සිරි වීර සුන්දරාරාමයේ ගොඩ නඟාගෙන යන බැම්මට සිමෙන්ති කොට්ට 50ක් ලබාදීම (රු.50,000.00)

06.05.05 සේනක පෙදෙසේ වාහන හැරවීමට ඇති එකම ස්ථානය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම (රු.40,000.00)

06.05.06 ගොරොක්ගහමඩ ජුම්මා දේවස්ථානයට දේව මෙහෙය පැවැත්වීමේ කටයුත්තට ප්ලාස්ටික් පුටු 50 ක් ලබාදිම. (රු.28,500.00)

06.05.07 සේනක පෙදෙසේ අවිහිංසා අවමංගල සමිතියට (කැනපි හට්) ටෙන්ට් එකක් ලබාදීම (රු.40,000.00)

06.05.08 සේනක පෙදෙසේ අවිහිංසා අවමංගල සමිතියට ප්ලාස්ටික් පුටු 30ක් ලබාදීම (රු.28,500.00)

06.05.09 බළන්ගොඩ නගරයේ වෙළෙඳ සංගමයට පුටු 50 ක් ලබාදීම.(රු.47,500.00)

06.05.10 බළන්ගොඩ නගරයේ අළුතින් සාදාගෙන යනු ලබන පත්තිනි කෝවිලට සිමෙන්ති කොට්ට 50ක් ලබාදීම (රු.50,000.00)

06.05.11 බළන්ගොඩ එක්සත් අවමංගල්‍යාධාර සමිතියට ප්ලාස්ටික් පුටු 50 ක් ලබාදීම (රු.47,500.00)

06.05.12 දෙවට පාරෙන් හැරෙන පටුමඟ මල්ලිකා මහත්මියගේ ගෙවල්වලට යන පාර කොන්ක්‍රීට් කිරීම ( රු.100,000.00)

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනා සියල්ල තම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉටු කරන බැවින් ඒ සඳහා අවසර ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.06 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

06.06.01 කිරිඳිගල මැද පාරේ බණ්ඩාර මහතාගේ නිවස අසල පාරේ එක්රැස්වන ජලය බැස යාම සඳහා කාණුව සකස් කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වැසි කාලයේ දී මෙම මාර්ගයේ යාමට නොහැකි ලෙස ජලය පිරී පවතින බැවින් එම මාර්ගයේ කාණුව සකස් කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සකස් කර දෙන ලෙස පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.07 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

06.07.01 ඕලුගංතොට සෙලෝවත්ත මාර්ගය සහ තේ ශක්ති කර්මාන්ත ශාලාව අසළ මාර්ගය දෙවන වර තාර දමා සංවර්ධනය කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.08 ලිපි මඟින් ලැබෙන යෝජනා**

06.08.01 මුල්ගෙදර වත්ත පාර සකස් කරගැනීම සඳහා ගල් රෝල ලබා ගැනීම සඳහා ප්‍රදේශවාසීන් කළ ඉල්ලීම.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 11,321,353.07 |
| වෙනත් ලැබීම් | 5,072,620.52 |
| මුලු ලැබීම් | 16,393,973.59 |
| පුනරාවර්තන වියදම් | 11,519,302.87 |
| වෙනත් වියදම් | 3,114,615.66 |
| මුලු වියදම් | 14,663,918.53 |

2020-07-01 දින සිට 2020-07-31 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 29,224.00 |
| 227-5020 | 41,080.00 |
| RD - 8240 | 24,100.00 |
| BC-0005 | 42,285.00 |
| GC 0001 | 12,135.00 |
| 226-7521 | 15,600.00 |
| RC 8183 | 5,200.00 |
| LL - 7688 | 5,200.00 |
| RD 8000 | 25,480.00 |
| HF - 8558 | 14,560.00 |
| RB 4786 | 5,200.00 |
| GK-1483 | 7,452.64 |
| GK-6227 | 20,065.00 |
| JD-4684 | 1,849.50 |
| LL-2110 | 21,094.00 |
| ND-5124 | 15,808.00 |
| PF-4006 | 31,416.00 |
| QL-2901 | 4,384.00 |
| 37-7933 | 4,680.00 |
| RC-1107 | 26,550.00 |
| RC 1118 | 35,360.00 |
| ZA 9835 | 14,560.00 |
| DDR 008 | 2,875.00 |
| OS 0006 | 1,870.00 |
| SDRR0013 | 16,640.00 |
| UQ - 1933 | 2,740.00 |
| VI 1833 | 1,096.00 |
| FP 0002 | 4,200.00 |
| HF 7899 | 27,940.00 |
| | 795.00 |
| DPP006 | 6,240.00 |
| CMW | 548.00 |

| | |
|---|---:|
| MG 0014 | 14,040.00 |
| OV M 0017 | 548.00 |
| ZA 0228 | 4,955.00 |
| ZA 5039 | 80,591.68 |
| YG-0758 | 2,055.00 |
| **එකතුව** | **570,416.82** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. ඇස්තමේන්තු අනුමත කිරීම.**

***08.01 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා***

08.01.01 සේනක පෙදෙස වාහන හැරවීමට ඇති ස්ථානය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. රු.80,000.00

08.01.02 බළන්ගොඩ හැටන් නැෂනල් බැංකුව අසළින් දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.රු.300,000.00

08.01.03 දේශබන්දු මහතාගේ නිවස අසළින් බලකොටුව පාරට යා වන කෙටි මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම.

08.01.04 දෙවට පාරෙන් හැරෙන පටුමග - මල්ලිකා මහත්මියගේ නිවාසවලට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. රු.100,000.00

ඉහත ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වූ අකිල එල්ලාවල මැතිතුමාට සුභ පතමින් තම අදහස් දැක්වීම ආරම්භ කරන ලද ගරු මන්ත්‍රීතුමා ගංවතුරෙන් විපතට පත්වූවන් සඳහා ආධාර මුදලක් ලබා දීම අත්හිටුවීමට තීරණය කළ නමුත් ඇතැම් පුද්ගලයන් ඉතා අසරණ තත්ත්වයට පත්ව ඇති බවද හැකියාවක් තිබේනම් ඔවුන් හට සහනයක් ලබා දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම ක්‍රීඩාංගනයේ අක්‍රීය වී ඇති විදුලි බුබුළු සවිකරන ලෙසත්, මහජන පොළ පොදු වැසිකිළිය ඉක්මනින් සකස් කර දෙන ලෙසත් පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා කොරෝනා වසංගතය නිසා කඩ කුලී අඩු කිරීම පිළිබඳ පළාත් සභාවේ තීන්දුව පැමිණ තිබේදැයි විමසූ අතර, මහජන පොළ මුර කුටිය වැඩ අවසන් කර ඇත්දැයි විමසන ලදී.

මීට අමතරව නගර සභා ආදායම වැඩි කිරීම සඳහා නොදිරන කසළ එකතු කරන ට්‍රැක්ටර් රථවල සභාව විසින් නිෂ්පාදනය කරන කොම්පෝස්ට් පොහොර පිළිබඳ දැන්වීම් ප්‍රදර්ශනය කරන ලෙසද පොහොර අලෙවි කිරීම සඳහා මීට වඩා හොඳ ක්‍රමවේදයක් සකස් කරන ලෙස ද පවසන ලදී. එමෙන්ම බුද්ධ ජයන්ති මාවත දාරුක් හාජ්ජියාර් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ විශාල වලක් පවතින බැවින් එය සකස් කරන ලෙසද මහජන ක්‍රීඩාංගනය සකස් කිරීම හා කොම්පෝස්ට් අංගනය සඳහා 2000 $C^{o}$ ක පිළිස්සුම් දාහකයක් ලබා ගැනීම පිළිබඳව සභාව හරහා යෝජනාවක් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා වෙත ඉදිරිපත් කිරීම සුදුසු බව ද වැඩිදුරටත් සඳහන් කළේය.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

තම පියාගේ අභාවය සිදුවූ අවස්ථාවේදී ශෝකය පළකිරීම සඳහා සහභාගී වූ ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා ද ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා ද තම ස්තුතිය පළකරන බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමිය මහජන පොළේ මාළු වෙළෙඳාම් කරන ස්ථානයේ කාණුව සකස් කළ නමුත් අප ජලය ගලා යාම එතරම් සාර්ථකව සිදු නොවන බැවින් ඒ පිළිබඳව සොයා බලා කටයුතු සිදු කරන ලෙස ද හැකියාවක් පවතීනම් ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසූ පරිදි ගංවතුරෙන් ආපදාවන්ට ලක්වූවන් සඳහා රු.10,000ක ආධාර මුදලක් ලබා දෙන ලෙස ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගංවතුරෙන් ආපදාවට ලක්වූ මුගුණමලේ පාලම සකස් කිරීම පිළිබඳ තත්ත්වය කුමක්දැයි විමසූ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කිරිඳිගල සඳහා හෙළ බොජුන්හලක් ඉදිකිරීම වෙනුවෙන් රුපියල් ලක්ෂ දහයක මුදලක් වෙන් කර ඇති බැවින් එම මුදල යොදාගෙන තුරු උයනෙහි හෙළ බොජුන් හල ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන ලෙස පවසන ලදී.

මීට අමතරව ගරු අකිල එල්ලාවල මැතිතුමන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මෙන්ම රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ලෙස පත්වීම පිළිබඳ තම සුබ පැතුම් පුද කරන බව සඳහන් කළේය.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ බළන්ගොඩ ආසන සංවිධායක ගරු අකිල එල්ලාවල මැතිතුමා බළන්ගොඩ ජනතාවගේ නියෝජිතවරයා වශයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව හා රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ලෙස පත්වීම පිළිබඳ තම සුභ පැතුම් එක් කරන බව පවසන ලදී. එමෙන්ම පසුගිය සභාවාරයේදී සාකච්ඡා කර ගත් පරිදි නගරයේ ජීවත්වන අසරණ මිනිසුන් හතර දෙනාගෙන් එක් අයෙකු වැඩිහිටි නිවාසයට භාර දීමට හැකි වූ බව ද ඒ පිළිබඳව සහයෝගය ලබා දුන් නගර සභාව වෙත ස්තුතිය පුද කරන බව ද සඳහන් කළ අතර, පසුගිය සභාවාරයේදී බුලත්ගම සුසාන භූමියේ ඇති

අඩුපාඩු පිළිබඳව දැන් වූ නමුත් ඒ සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිඳු පියවරක් ගෙන නොමැති බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පෙර පාසල් ගුරුතුමිය සඳහා දීමනාව ලබා දීම පිළිබඳව පළාත් සභා අනුමැතිය ලබා දී ඇති දැයි වැඩිදුරටත් විමසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

බළන්ගොඩ ආසනය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොමැති වීම නිසා පාර්ලිමේන්තු මැතිවරණය මඟින් බළන්ගොඩ නගරයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලබා ගැනීම සඳහා පසුගිය මාස එක හමාරක කාලය තුළ බොහෝ වෙහෙස මහන්සි වී කටයුතු කළ අතර, ඒ වෙනුවෙන් ඡන්දය ලබා දුන් සියළු ඡන්දදායකයින් වෙනුවෙන් ස්තුතිය පුද කරන බව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම බොහෝ අය අකිල එල්ලාවල මැතිතුමාට පමණක් උදව් කරමින් වැඩ කටයුතු කළ බව ද ඇතැමුන් වචනයකින්වත් උදව් නොකළ නමුත් නොසිතූ පරිදි ජයග්‍රහණය කළ බව ද මෙම පස් වසර සඳහා තම පක්ෂය වෙනුවෙන් තමන් අකිල මැතිතුමා සමඟ සිටින බව ද පැවසීය. සංවර්ධන කටයුතු සිදු කිරීම, රැකියා ලබා දීම, ජාතික පාසල්වල ඇති අඩුපාඩුකම්, රෝහල්වල ඇති අඩුපාඩුකම්, ජානීය ජල පහසුකම්, ඔප්පු නොමැති ඉඩම් සඳහා ඔප්පු ලබා දීම, මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම, කොම්පෝස්ට් ව්‍යාපෘතිය නවීකරණය කිරීම හා ක්‍රිඩා පිටිය සංවර්ධනය කිරීම ආදිය ඉටු කිරීමට අවශ්‍ය උපරිම සහයෝගය එතුමාට ලබා දෙන බව ද ඒ සඳහා ඔහුට ශක්තිය ධෛර්යය ලැබේවා යි ප්‍රාර්ථනා කරන බව ද සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා මෙතරම් කාලයක් වෙනත් දිස්ත්‍රික්කවල මන්ත්‍රීවරුන් විසින් බළන්ගොඩ නගරය දියුණු කිරීමට ලබා දුන් සහයෝගය පිළිබඳව එතුමන්ලාහට තම ස්තුතිය පළ කරන බව ද පැවසීය. ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

ඉතිහාසයේ ප්‍රථම වතාවට නගරයේ මුස්ලිම් ජනතාව පක්ෂ පාට හා ජාති භේදයකින් තොරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාට ඡන්දය භාවිතා කර ඇති බවද වසර 26කට පසුව බළන්ගොඩ ප්‍රදේශය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස එතුමා පත් කිරීම පිළිබඳව සිංහල, දමිල හා මුස්ලිම් ජනතාවට මෙන්ම බළන්ගොඩ භාරකාර මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු සියලු දෙනා වෙත තම ස්තුතිය පුද කරන බව ද ප්‍රකාශ කරන ලදී. මෙවර මැතිවරණයෙන් බළන්ගොඩ ආසනයේ සෑම කොට්ඨාසයක්ම ජයග්‍රහණය කිරීමට හැකි වූ අතර හැමදාම මුස්ලිම් හා ද්‍රවිඩ ජනතාව රැවැට්වීමට නොහැකි බව ද පෝස්ටර් කටවුට් වලින් තොරව මහ මැතිවරණය සිදු කළ අතර සෑම දෙනාගේම සිහිනය සඵල වූ බව ද පවසන ලදී. මුස්ලිම් ජනතාව විසින් ඡන්දයට පෙර හා පසු උත්සවයක් පැවැත්වූ අතර පවතින රජයත් සමඟ වැඩ කටයුතු කිරීමට එක්වන ලෙස මුස්ලිම් ජනතාවට ආයාචනා කරමින් අකිල මැතිතුමාගේ ඉදිරි සියලු කටයුතු සාර්ථකව සිදු කිරීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**10. අවසානය**

වසර 26 කට පසුව ලැබුණු ආශිර්වාදයක් වශයෙන් බළන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට සේවය කිරීම සඳහා බළන්ගොඩ ආසනයෙන් මන්ත්‍රීවරු දෙදෙනෙකු තේරී පත්වී ඇති අතර ඔවුන් දෙදෙනාට ද සමඟි ජන බලවේගයෙන් තේරී පත් වූ තලතා අතුකෝරල මැතිතුමියටද බළන්ගොඩ ජනතාවට සේවයක් කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරමින් හා ගම්පෙරළිය වැඩසටහන යටතේ මුදල් ප්‍රතිපාදන බළන්ගොඩ ප්‍රදේශයට ලබා දී ගම් වල විශාල වැඩ කොටසක් සිදු කිරීමට අවස්ථාවන් සැලසීම පිළිබඳව ස්තුතිය පළ කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.